**2025-11-04 බළන්ගොඩ ප්‍රාදේශීය සභා**
**විශේෂ මහා සභා රැස්වීමේ**
**සංක්ෂිප්ත වාර්තාව**

2025 නොවැම්බර් මස 04 වන දින බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

**සහභාගිත්වය :**

1. ගරු සභාපති - ගමඇතිගේ ආරියදාස මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බී.ගුණරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.නන්දසිරි මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.සමන් කුමාර මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.කේ.අජිත් ප්‍රියන්ත මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ශ්‍රියානි මැතිනිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.අසෝක්කුමාර් මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩී.ඉඳුනිල් ප්‍රියන්ත මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.රෝහණ පුෂ්පකුමාර මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ටී.කුසුම්සිරි අලංකාර මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය

**සහභාගි නොවූ -**

1. ගරු උපසභාපති - බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.දර්මදාස මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

අපිට අද විශේෂ මහා සභා රැස්වීමක් කැඳවන්න සිදු වුණා. මොකද අපිට සංවර්ධන ව්‍යාපෘති 03ක් ඇවිල්ලා තිබුණා. අවුරුද්දේ අවසානය නිසා අපි මේ ටිකට කඩිනමින් අනුමැතිය අරන් වැඩ ආරම්භ කරන්න ඕනි. එකක් තමයි සභා ගොඩනැගිල්ලේ ඉතුරු ටික හදා ගන්න එක, තව ජල ව්‍යාපෘති ඇවිල්ලා තියෙනවා 02 ක්. අනික තව කාරණයක් තියෙනවා අපිට 13 විශේෂ වැඩක් යෙදිලා තිබෙනවා. ඒ නිසා අපි 13 දිනට තිබුණු මහා සභා රැස්වීම 12 වෙනිදාට යොදා ගන්න හිතුවා. අපි මේ ගැන එදා ඒකාබද්ධ කාරක සභාවේදිත් සාකච්ඡා කළා. ඒ වගේම මේ ව්‍යාපෘති 03 ට අනුමැතිය ගන්න12 වෙනිදා පවත්වන සභාවට දැම්මොත් කල් වැඩි නිසා තමයි අපි විශේෂ සභාවක් මේ විදියට කැඳෙව්වේ. එතකොට පළාත් සභා ප්‍රතිපාදන මත තමයි මේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙන්නේ. එම ව්‍යාපෘති ලක්ෂ 20ට වැඩි ව්‍යාපෘති නිසා සභා අනුමැතිය ගන්න අවශ්‍ය වෙනවා. මම ව්‍යාපෘති 03 කියන්නම්.

01. නවනැලිය ජල ව්‍යාපෘතිය
02. ගල්ඉන්න ජල ව්‍යාපෘතිය
03. බළන්ගොඩ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව විවෘතටෙන්ඩර් පටිපාටිය යටතේ, පත්තර දැන්වීම් පළ කිරීම මගින් මිල ගණන් කැඳවීම සිදු කළා. ඒ අනුව ලද ලංසුපත් සියල්ල තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කරලා තියෙනවා. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් නිර්දේශ ඉදිරිපත් කරලා තියෙනවා. ඒ නිර්දේශ පදනම් කර ගෙන ටෙන්ඩර් මණ්ඩලය තීරණයක් අරන් තියෙනවා. අන්න ඒ තීරණවලට අනුමැතිය තමයි අපි මේ සභාව මගින් ගන්න ඕනි. ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට අවබෝධ කර ගැනීමේ පහසුව සඳහා එකින් එක මම විස්තර කරන්නම්.

**<u>01.නවනැලිය ජල ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම පිළිබඳ තීරණය කිරීම සහ ගිවිසුම් කෙටුම්පතට අනුමැතිය ලබා ගැනීම.</u>**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කර්මාන්තය සඳහා ලංසුපත් 01 ක් පමණක් ඉදිරිපත් වෙලා තියෙනවා . මෙම කර්මාන්තය සඳහා ඉදිරිපත් කර ඇති ලංසුපත් අතරින් අවම සාර්ථක ලංසුපත ඉදිරිපත් කර ඇත්තේ එස්.බී.එම්. කොලිටි කන්ස්ට්‍රක්ෂන්ස්, 39/25B , මාදොල අවිස්සාවේල්ල ආයතනය වන අතර එහි පිළිගත් ලංසු වටිනාකම රු. 2,450,440.00ක්. මෙම අගය ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ වටිනාකමට වඩා 0.356 % අඩු වීමකි. ඒ අනුව මෙම කර්මාන්තය සඳහා එස්.බී.එම්. කොලිටි කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනයට රු.2,450,440.00 (රුපියල් විසි හතර ලක්ෂ පනස්දහස් හාරසීය හතළිහ ) යන මුදලට පිරිනැමීම සුදුසු බව තාක්ෂණික ඇගයීම් මණ්ඩලය නිර්දේශ කරලා තියෙනවා.
එබැවින් අවම සාර්ථක ලංසුවක් ඉදිරිපත් කර ඇති එස්.බී.එම්. කොලිටි කන්ස්ට්‍රක්ෂන්, 39/25B , මාදොල අවිස්සාවේල්ල,යන ආයතනයට අඩු වැඩි මිල ගණන් තුලනය කිරීමෙන් පසු රු. 2,450,440.00 (රුපියල් විසි හතර ලක්ෂ පනස්දහස් හාරසීය හතළිහ ) මුදලකට කර්මාන්තය ඉටු කිරීමට පිරිනැමීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය විසින්ද ඒකමතිකව තීරණය කරලා තියෙනවා.

- ඒ අනුව එස්.බී.එම්. කොලිටි කන්ස්ට්‍රක්ෂන්, 39/25B , මාදොල අවිස්සාවේල්ල, යන ආයතනයට රු. 2,450,440.00 (රුපියල් විසි හතර ලක්ෂ පනස්දහස් හාරසීය හතළිහ ) මුදලකට නවනැලිය ජල ව්‍යාපෘතිය කර්මාන්තය ඉටු කිරීමට පිරිනැමීම සඳහා මහා සභාව අනුමැතිය ලබා දෙන ලදී.

**<u>02. ගල්ඉන්න ජල ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම පිළිබඳ තීරණය කිරීම සහ ගිවිසුම් කෙටුම්පතට අනුමැතිය ලබා ගැනීම.</u>**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කර්මාන්තය සඳහා ලංසුපත් 01 ක් පමණක් ඉදිරිපත් වෙලා තියෙනවා. මෙම කර්මාන්තය සඳහා ඉදිරිපත් කර ඇති ලංසුපත් අතරින් අවම සාර්ථක ලංසුපත ඉදිරිපත් කර ඇත්තේ එස්.බී.එම්. කොලිටි කන්ස්ට්‍රක්ෂන්, 39/25B , මාදොල අවිස්සාවේල්ල ආයතනය වන අතර එහි පිළිගත් ලංසු වටිනාකම රු. 2,393,836.25ක්. මෙම අගය ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ වටිනාකමට වඩා 0.1975 % අඩු වීමකි. ඒ අනුව මෙම කර්මාන්තය සඳහා එස්.බී.එම්. කොලිටි කන්ස්ට්‍රක්ෂන් ආයතනයට රු. 2,393,836.25 (රුපියල් විසි තුන් ලක්ෂ අනූතුන

දහස් අටසීය තිස් හයයි ශත විසි පහයි ) යන මුදලට පිරිනැමීම සුදුසු බව තාක්ෂණික ඇගයීම් මණ්ඩලය නිර්දේශ කරලා තියෙනවා.
එබැවින් අවම සාර්ථක ලංසුවක් ඉදිරිපත් කර ඇති එස්.බී.එම්. කොලිටි කන්ස්ට්‍රක්ෂන්, 39/25B , මාදොල අවිස්සාවේල්ල, යන ආයතනයට අඩු වැඩි මිල ගණන් තුලනය කිරිමෙන් පසු රු. 2,393,836.25 (රුපියල් විසි තුන් ලක්ෂ අනූතුන දහස් අටසීය තිස් හයයි ශත විසි පහයි ) මුදලකට කර්මාන්තය ඉටු කිරිමට පිරිනැමීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය ඒකමතිකව තීරණය කරලා තියෙනවා.

- ඒ අනුව එස්.බී.එම්. කොලිටි කන්ස්ට්‍රක්ෂන්, 39/25B , මාදොල අවිස්සාවේල්ල, යන ආයතනයට රු. 2,393,836.25 (රුපියල් විසි තුන් ලක්ෂ අනූතුන දහස් අටසීය තිස් හයයි ශත විසි පහයි ) මුදලකට ගල්ඉන්න ජල ව්‍යාපෘතිය කර්මාන්තය ඉටු කිරිමට පිරිනැමීම සඳහා මහා සභාව අනුමැතිය ලබා දෙන ලදී.

**03. බලංගොඩ ප්‍රාදේශීය සභාවේ කාර්යාල ගොඩනැගිල්ල වැඩි දියුණු කිරිම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම පිළිබඳ තීරණය කිරීම සහ ගිවිසුම් කෙටුම්පතට අනුමැතිය ලබා ගැනීම.**
මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කර්මාන්තය සඳහා ලංසුපත් 02 ක් පමණක් ඉදිරිපත් වෙලා තියෙනවා. මෙම කර්මාන්තය සඳහා ඉදිරිපත් කර ඇති ලංසුපත් අතරින් අවම සාර්ථක ලංසුපත ඉදිරිපත් කර ඇත්තේ නාලක කන්ස්ට්‍රක්ෂන් ,මොරහැල බලංගොඩ ආයතනය වන අතර එහි පිළිගත් ලංසු වටිනාකම රු. 7,517,128.61ක්. මෙම අගය ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ වටිනාකමට වඩා 0.05% අඩුවීමකි. ඒ අනුව. මෙම කර්මාන්තය සඳහා කොන්ත්‍රාත්කරුගේ වැඩ වටිනාකම වන රු 7,517,128.61 (රුපියල් හැත්තෑ පන්ලක්ෂ දාහත්දහස් එකසීය විසිඅටයි ශත හැටඑකයි) මුදලකට පිරිනැමීම සුදුසු බව තාක්ෂණික ඇගයීම් මණ්ඩලය නිර්දේශ කරලා තියෙනවා.
එබැවින් අවම සාර්ථක ලංසුවක් ඉදිරිපත් කර ඇති නාලක කන්ස්ට්‍රක්ෂන්,මොරහැල , බලංගොඩ ආයතනය අඩු වැඩි මිල ගණන් තුලනය කිරිමෙන් පසු රු .7,517,128.61 (රුපියල් හැත්තෑ පන්ලක්ෂ දාහත්දහස් එකසීය විසිඅටයි ශත හැට එකයි.) මුදලකට කර්මාන්තය ඉටු කිරිමට පිරිනැමීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය ඒකමතිකව තීරණය කරලා තියෙනවා.

- ඒ අනුව නාලක කන්ස්ට්‍රක්ෂන්,මොරහැල , බලංගොඩ ආයතනයට රු.7,517,128.61 (රුපියල් හැත්තෑ පන්ලක්ෂ දාහත්දහස් එකසීය විසිඅටයි ශත හැට එකයි.) මුදලකට බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ කාර්යාල ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමේ කර්මාන්තය ඉටු කිරිමට පිරිනැමීම සඳහා මහා සභාව අනුමැතිය ලබා දෙන ලදී.

අපි පළාත් සභාව එක්කත්, ගරු ආණ්ඩුකාරතුමිය එක්කත්, කොමසාරිස්තුමා එක්කත් කතා කරලා , ප්‍රධාන ලේකම්තුමියත් එක්කත් සාකච්ඡා කළා. ඇත්තටම අපිට දැන් සභාව පවත්වාගෙන යන්න තැනක් නැහැ. මේ අවුරුද්දේ සියළු ඉදිකිරීම් ආණ්ඩුවක් විදියට නතර කරලා තියෙන්නේ. ඒ කියන්නේ ගොඩනැගිලිවලට. නමුත් අපේ ඉල්ලීම මත තමයි පළාත් සභාවෙන් මුදල් වෙන් කරන්නේ. ඉතින් ඒ මුදල් ආපසු යන්න දෙන්න බැහැ. ඒ නිසා අපි කොහොමත් දෙසැම්බර් තව මාස 02යි තියෙන්නේ. අපිට අවුරුද්ද මුල වගේ වුණානම් මහා සභාවකට දාලා කර ගන්න තිබුණා. හරි ඒ වගේම අපේ 13 සභාව 12 වෙනිදා යොදා ගන්න එකට කාගේවත් ගැටලුවක් තියෙනවනම් කියන්න. ගැටලුවක් නැත්තම් අපි 12 වෙනිදට පවත්වමු. ඉතින් මෙන්න මේ කියන කාරණා සඳහා තමයි අපි විශේෂ සභාවක් අද මේ විදියට කැඳෙව්වේ. ඉතින් අද මේ අවස්ථාවට , බොහෝ කාර්යබහුල වුණත් මේ අවස්ථාව තේරුම් අරගෙන සම්බන්ධ වුණු සියළු දෙනාටම මම ස්තුතිවන්ත වෙනවා.
ඒ අනුව පෙ.ව.10.20ට සභාවේ කටයුතු අවසන් කරන ලදී.

ගම ඇතිගේ ආරියදාස
සභාපති
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව